බන්ධනාගාර කොට සිටින කංජිපානි ඉම්රාන් නමින් හැඳින්වෙන අයගේ පියා වෙත තියුණු ආයුධයකින් සිදුකළ පහර දීමක් සම්බන්ධයෙන් අදාළ සීසීටීවී දර්ශන, රූපවාහිනී නාලිකා කිහිපයක පුවත් විකාශයන් ඔස්සේ විකාශය විණි. එහිදී මෙම නාලිකාවන් සියල්ලම මගින්, නැරඹීමට අපහසු දර්ශන අන්තර්ගත වන බවට පූර්ව දැනුම් දීමක් සිදුකොට තිබිණි. කෙසේ නමුත්, අද දෙරණ ඔස්සේ පමණක් එම සීසීටීවී දර්ශන බොඳ කොට ප්‍රචාරය කරනු ලැබූ අතර, හිරු ටීවී, සිරස ටීවී සහ ස්වර්ණවාහිනී පුවත් මගින් මෙම සීසීටීවී දර්ශන ඒ ආකාරයෙන්ම විකාශය කරන්නට යෙදිණි.

බිය හා තැතිගැන්ම දනවන සුළු මෙවන් දසුන් බොඳ කිරීමකින් හෝ වෙනත් එවැනි ආවරණය කිරීමකින් තොරව විකාශය කිරීම යෝග්‍ය වේ යැයි ඔබ සිතන්නේද? ඒ සම්බන්ධයෙන් සිදුකර ඇති පූර්ව දැනුම්දීම පමණක් ප්‍රමාණවත් වේද?

#MediaEthicsSL #AdaDerana #HiruTV #SirasaTV #Swarnavahini